Sinhalese

# ඖෂධ අසාත්මිකතා සහ අහිතකර ප්‍රතිචාර

VicTAG
VICTORIAN THERAPEUTICS ADVISORY GROUP

### අහිතකර ප්‍රතිචාරයක් යනු කුමක්ද?

අහිතකර ප්‍රතිචාරයක් යනු බෙහෙතක් පාවිච්චි කිරීම හා සම්බන්ධව ඇතිවිය හැකි හානිකර ප්‍රතිඵලයයි. අසාත්මික සහ අසාත්මික නොවන ප්‍රතිචාර, බෙහෙත් අතර ප්‍රතිචාර සහ අතුරු ඵල මීට අයත් වේ.

### බෙහෙත් අසාත්මිකතාවයක් යනු කුමක්ද ?

බෙහෙත් අසාත්මිකතාවයක් යනු ප්‍රතිශක්ති පද්ධතිය හා සම්බන්ධව ඇතිවන හානිකර ප්‍රතිඵලයයි .

අසාත්මික ප්‍රතිචාර මෘදු (පලු මතුවීම) වී ඔබට නැවත බෙහෙත පාවිච්චි කිරීමට පුළුවන් විය හැකිය. නැතහොත් අසාත්මික ප්‍රතිචාර උග්‍ර වී (දරුණු අසාත්මික ප්‍රතික්‍රියාව) ඔබට නැවත බෙහෙත පාවිච්චි කිරීමට නොහැකි විය හැකිය.

බෙහෙත් අසාත්මිකතා ක්ෂණිකව (බෙහෙත පාවිච්චි කර පැයක් ඇතුලත ඇතිවන) හෝ ප්‍රමාද වී (බෙහෙත පාවිච්චිය පටන් ගෙන දින හෝ සති ගණනකට පසු ඇතිවන) ඇතිවිය හැක.

අසාත්මික ප්‍රතිචාරයකට මේවා ඇතුලත් විය හැක:

- සමේ පලු මතුවීම, කුෂ්ට (hives) සහ/හෝ කැසීම
- ශබ්ද නගමින් හුස්ම ගැනීම හෝ වෙනත් ශ්වසන ගැටලු
- ඉදිමුම
- දරුණු අසාත්මික ප්‍රතික්‍රියාව

ළමා කාලයේ හටගත් සමහර අසාත්මිකතා වැඩිහිටි වයසේදී තවදුරටත් හට නොගැනීමට ඉඩ තිබේ. ඔබට ළමා වියේ තිබුන අසාත්මිකතා තවමත් වැදගත්ද යන්න සොයා ගැනීමට ඔබට අසාත්මිකතා පරීක්ෂණයක් කර ගැනීමට පුළුවන.

ඔබ බෙහෙතකට අසාත්මික ප්‍රතික්‍රියා දැක්වුව හොත් ඔබ බෙහෙත ගැනීම නතර කර ඔබේ වෛද්‍යවරයා ඇමතිය යුතුය. ප්‍රතික්‍රියාව දරුණු නම් 000 අමතන්න.

### අතුරු ඵල

ඔක්කාරය, පාචනය සහ හිසරදය ඇතිවිය හැකි අතුරු ඵල අතරට ඇතුල් වන අතර සාමාන්‍යයෙන් මේවා සුළු සහ තාවකාලික අතුරු ඵලයන්ය. මේවා අසාත්මික ප්‍රතිචාර නොවන අතර ඔබට නැවත බෙහෙත පාවිච්චි කිරීමට පුළුවන.

### ඔබේ බෙහෙත් අසාත්මිකතා සහ අහිතකර ප්‍රතිචාර සඳහා ඔබ කළ යුත්තේ කුමක්ද?

ඔබේ වෛද්‍ය වාර්තාවේ අපට සටහන් කර ගැනීමට හැකි වනු පිණිස, ඔබට මින් පෙර යම් බෙහෙත් වලට අහිතකර ප්‍රතිචාර හටගෙන තිබේදැයි ඔබ රෝහල් ගත වූ විට ඔබෙන් අසනු ඇත. ඔබ මීට පෙර අහිතකර ප්‍රතිචාර දක්වා ඇති බෙහෙතක් ඔබට අප විසින් නොදීමට සහතික කර ගැනීම අපට අවශ්‍යය.

පහත දේවල් අපට කියන්න:

- ප්‍රතිචාරයක් හට ගත්තේ කුමන බෙහෙතටද
- එය හටගත්තේ කවදාද
- ප්‍රතිචාරය කුමක්ද

රෝහලේදී ඔබට දෙන ලද ඕනෑම බෙහෙතක් ගැන යම් ප්‍රශ්න ඔබට ඇත් නම් සාත්තු සේවක, වෛද්‍යවරයා හෝ ඖෂධවේදියාගෙන් නොපැකිල ඒ ගැන අසන්න.

ඔබට ප්‍රතිචාරයක් හටගන ඇත්නම්, ඒ ගැන ඔබේ සත්කාරකයන්, වෛද්‍යවරුන් සහ ඖෂධවේදීන් සමග බෙදා හදා ගැනීමට හැකි වනු පිණිස, එම ප්‍රතිචාර පිළිබඳ ලිඛිත තොරතුරු ඔබට ලබාදෙන බව සහතික කර ගන්න. ඔබට බෙහෙත් වලට හටගන ඇති ප්‍රතිචාර ගැන ඔබේ ප්‍රදේශයේ වෛද්‍යවරයා සහ ඖෂධවේදියා සමග සෑම විටම කියන්න.

ඔබට යම් බෙහෙතකට දරුණු ප්‍රතික්‍රියාවක් හටගන තිබේ නම් ඒ ගැන ඔබ ලිඛිත තොරතුරු ලඟ තබා ගන්නා ලෙස නිර්දේශ කරනු ලැබේ. මෙමගින් ඔබට වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය වුවිට ඒ ගැන ගැන අනිකුත් අයට අනතුරු හැඟවීමට හැකි වේ . ඔබේ පර්ස් හෝ වොලට්ටුවේ අනතුරු හැඟවීම් කාඩ් පතක් තබා ගැනීම හෝ MedicAlert® වළල්ලක් හෝ මාලයක් පැළඳීම මීට උදාහරන වේ.

Consumer reviewed
March 2020

English

# Medication allergies and adverse reactions

## What is an adverse reaction?

An adverse reaction is the possible harmful effect related to taking a medicine. This includes allergic and non-allergic reactions, interactions between medicines and side effects.

## What is a medicine allergy?

A medicine allergy is when an adverse reaction occurs involving the immune system.

Allergic reactions may be mild (rash) and you may be able to have the medicines again or reactions may be severe (anaphylaxis) and you should not have the medicine again.

Medicine allergies may be immediate (occurring within an hour of having the medication) or delayed, occurring days or weeks after the medication has been started.

An allergic reaction may include:

- skin rash, hives and/or itching
- wheezing or other breathing problems
- swelling
- anaphylaxis

Some allergies experienced in childhood may no longer affect you as an adult. You may want to have allergy testing to find out if your childhood reactions are still important.

If you are having an allergic reaction to a medicine, you should always stop the medicine and contact your doctor. If the reaction is severe call 000.

## Side effects

Side effects to medicines may include nausea, diarrhoea and headache and are usually minor and temporary. These are not allergic reactions and you may be able to have these medications again.

## What do you need to do about your medication allergies and adverse reactions?

While in hospital you will be asked if you have had any adverse reactions to medicines so we can document the reaction in your medical record. We want to make sure we do not give you a medicine you have had a reaction to in the past. Please let us know:

- which medicines caused a reaction
- when it happened and
- what the reaction was

Feel free to ask your nurse, doctor or pharmacist if you have questions about any medicines you are given in hospital.

If you have a reaction, make sure you are given information in writing about the reaction to share with your carers, doctors and pharmacists. Always tell your local doctor and pharmacist about any reactions you have had to medicines.

If you have had a severe reaction to a medicine, it is recommended that you carry written information with you to alert others in case you need medical attention. Examples of this include an alert card in your wallet or purse or wearing a MedicAlert® bracelet or pendant.

Consumer reviewed
March 2020